.

**මාතර ප්‍රාදේශීය සභාව**

**මාතර දිස්ත්‍රික්කය**

**---------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මාතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාවට ලැබී තිබූ ඉඩමක වටිනාකම ප්‍රාග්ධනිත කිරීමේදී රු.1,800,000 ක් අඩුවෙන් හා තවත් ඉඩමක වටිනාකම රු.400,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාව සතු රු.19,111,217 ක් වටිනා ඉඩම් 11 ක් ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබූ අතර අක්කර 03, පර්චස් 31.8 ක් වූ ඉඩම් 03 ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.270,767 ක් වටිනා ලීබඩු හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය වෙනුවෙන් කර්මාන්තකරුවන්ට ආපසු ගෙවිය යුතු සියයට 10 යේ රඳවුම් තැන්පතු 38 ක වටිනාකම වූ රු.2,527,618 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු සියයට 10 රඳවුම් තැන්පතුවල වටිනාකම රු.507,312 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ණය පදනම මත ලබා ගෙන තිබූ සේවා වෙනුවෙන් ගෙවිය යුතු රු.396,293 ක වටිනාකම වර්ෂයේ වියදම් සහ ණයහිමි ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) රු.107,477 ක් වූ ගබඩා ද්‍රව්‍ය අයිතම 38 ක වටිනාකම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඌ) ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.10,043,702 ක් වූ උසාවි දඩ මුදල් හා රු.49,300,228 ක මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුල සභා අරමුදල් මගින් නිම කර තිබූ කැකනදූර සතිපොලේ වැසිකිලි පද්ධතිය වෙනුවෙන් දරන ලද රු. 685,989 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත 05 ක් වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන රු.84,600 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) 2017 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අරමුදල සඳහා ගෙවිය යුතු රු.39,614 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයට ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 අසම්භාව්‍ය බැරකම්**

සභාවේ ප්‍රධාන කාර්යාලය පිහිටි වටිනාකම රු.2,704,750 ක් වූ ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට එරෙහිව දිසා අධිකරණයෙහි පවරා තිබූ නඩුව පිළිබඳව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ හා උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, අසමානතාවල එකතුව රු.1,672,647 ක් විය.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට රු.120,825,956 ක් වූ හිඟ හිටි වෙනත් ආදායම් ශේෂය තුළ අවුරුදු 03 ක කාලයක් ඉක්ම වූ රු.77,912,707ක් වූ ශේෂ 06 ක් ඇතුළත් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට අයකරගත හැකි උපයෝගී සේවා යටතේ මාතර මහා නගර සභාවෙන් අයවිය යුතු ලෙස රු.1,942,225 ක් දැක්වූවද, මාතර මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි ශේෂයක් සඳහන් නොවන බැවින් මෙම මුදල අයවීමේ අවිනිශ්චිතභාවයක් පැවතුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.54,827,045 ක ප්‍රාග්ධන ණයහිමි ශේෂය තුළ අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබූ රු.43,058,756 ක් වටිනා ණය ශේෂ වර්ග 13 ක් ඇතුළත් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.10,267,338 ක් වූ ආපසු ගෙවිය යුතු විවිධ තැන්පතු වටිනාකම තුළ අවුරුදු 03 ට වැඩි කාලයක් ඉක්මවා තිබූ රු.8,173,131 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.133,891,101 ක් වූ ගිණුම් විෂයයන් 16 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 අනුකූල නොවීම්**

-------------------

**1.3.6.1 නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව හා දේපළ තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 141 | කර්මාන්ත පිළිබඳ සියයට 10 රැඳවුම් මුදල් තැන්පත් ලේඛනයේ සටහන් කර නොතිබුණි. |
| (iii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) රීති 217 හා 218 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ලේඛනයක් අංක පී.එස් 46 දරන ආකෘතිය ප්‍රකාරව පවත්වා නොතිබුණු අතර, වාර්ෂික සමීක්ෂණ ද පවත්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.137 (5) | සැපයීමක් සම්බන්ධව ගෙවීම් කිරීමේදී එම භාණ්ඩ නිවැරදිව භාරගත් බවට තහවුරු කරගෙන ගෙවීම් අනුමත කළ යුතු වුවද, අදාළ භාණ්ඩ ලැබුණු බවට හා ඒවා භාරදුන් බවට සහතික කරවා ගැනීමකින් තොරව ටී ෂර්ට් 89 ක් ලබා ගැනීම සඳහා රු.55,000 ක මුදලක් වැයකර තිබුණි. |

| | |
|---|---|
| (ii) මු.රෙ.396 (ඇ) | නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල මාස 06 ක කාලය ඉක්මවූ රු.602,033 ක් වටිනා චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) මු.රෙ.565 (4) | එකතුව රු.8,876,677 කට අදාළ පොදු තැන්පත් ගිණුමේ එක් එක් ගිණුම් ශේෂය සැදුම්ලත් ආකාරය හඳුනාගෙන ඉදිරියට ගෙනවිත් නොතිබුණි. |
| (ඇ) 2014 දෙසැම්බර් 30 දිනැති අංක 2014/3(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට අදාළ නොවන අයුරින් ප්‍රජා සංවර්ධන නිලධාරී සඳහා රු.13,750 ක දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. |
| (ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවට අයත් වාහන 18 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.36,726,325 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 34,464,557 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

-------------

(අ) 2013 ජනවාරි 01 දින සිට අක්‍රීයව පවතින බැංකු ජංගම ගිණුමට අදාළ බැංකු සැසඳුම අනුව නිකුත් කල නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකල රු. 601,508 ක චෙක්පත නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ආ) (i) සභාවට අයත් පොදු අරමුදල් බැංකු ගිණුමෙන් නිකුත් කල නමුත් වර්ෂ 03 සිට 05 ක කාලයක් දක්වා බැංකු ගිණුමට හර වී නොතිබුණු රු. 5,598 ක මුදල හා ජල ගිණුමට අදාළ රු.7,088 ක මුදල වර්ෂ 05 ක කාලයක් තිස්සේ නිරවුල් කර නොතිබුණි.

(ii) බැංකු ගිණුමට වැඩිපුර තැන්පත් ලෙස ලැබී තිබූ, පොදු ගිණුමේ රු.80,819 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) සාමාන්‍ය මුදල් ගිණුමේ රු.83,550,811 ක අවසන් ශේෂය හා කර්මාන්ත මුදල් ගිණුමේ රු.5,616,053 ක අවසන් ශේෂයේ අවශ්‍යතාවයට සරිලන මුදලක් රඳවාගෙන ඉතිරි මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර පොලී ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

----------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,409,360 | 6,660,213 | 4,957,468 | 5,731,941 | 3,948,310 | 4,978,655 | 3,407,157 | 4,029,196 |
| කුලී | 2,143,100 | 1,670,214 | 1,701,914 | 687,985 | 2,798,100 | 2,055,658 | 2,113,635 | 719,685 |
| බලපත්‍ර ගාස්තු | 1,423,920 | 2,496,939 | 2,360,686 | 241,613 | 1,500,000 | 2,490,459 | 2,402,999 | 105,360 |
| වෙනත් ආදායම් | 27,320,750 | 42,769,981 | 33,769,981 | 41,615,076 | 32,827,500 | 35,373,346 | 212,419,746 | 32,615,076 |
| -එකතුව- | 36,297,130 | 53,597,347 | 42,790,049 | 48,276,615 | 41,073,910 | 44,898,118 | 220,343,537 | 37,469,317 |

**2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

**-------------------------------------**

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත මුළු ආදායම රු.36,297,130 ක් වූ අතර බිල්කළ ආදායම රු.53,597,347 ක් විය. රු.37,469,317 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු. 91,066,664 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.42,790,049 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.48,276,615 ක් වී තිබුණි.

**2.3.3 වරිපනම් හා බදු**

-----------------

**(අ) වරිපනම් බදු**

---------------

ආරම්භක හිඟ ශේෂය රු.4,017,281 ක් වූ අතර, රු.4,990,889 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.9,008,170ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු. 3,217,597 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.5,790,573 ක් දක්වා හිඟ ශේෂය වර්ධනයවී තිබුණි.

**(ආ) අක්කර බදු**

**-----------**

ආරම්භක අක්කර බදු හිඟ ශේෂය රු.11,915ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් (ගාස්තු හා දඩ සමග) රු.2,906 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.240 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.14,581 ක් හිඟව පැවතුණි.

**2.3.4 කුලී**

**----**

ආරම්භක හිඟ කුලී ශේෂය රු.390,635 ක් වූ අතර, රු.1,408,526 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.1,799,161 **ක්** අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,440,226 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.358,935 ක් හිඟව පැවතුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**---------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.7,500,000 ක් හා මුද්දර ගාස්තු රු.29,000,000 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කාර්ය සාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**-----------------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) පරිසර කලාප ඇති කිරීම සඳහා දකුණු පළාත් පරිසර අමාත්‍යාංශයෙන් 2017 නොවැම්බර් 27 දින සභාවට ලැබී තිබූ රු.553,900 ක මුදලක් සහ නිලධාරීන්ට අදාළ නිල ඇඳුම් ලබා දීම සඳහා 2017 අගෝස්තු 30 දින පෞද්ගලික ආයතනයකින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.75,000 ක මුදල අදාළ කාර්යය සඳහා වැය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ii) වර්ෂ කීපයක සිට ඉදිරියට එන ගොඩනැගිලි සංවර්ධන අරමුදලට යැවිය යුතු රු.40,200 ක මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සභා අරමුදලින් රු.12,250,000 ක් වූ වැඩ යෝජනා 18 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත්, වටිනාකම රු.1,569,212 ක් වූ වැඩ යෝජනා 04 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද, අයවැය ලේඛනයට ඇතුළත් නොකළ එකතුව රු.3,315,849 ක් වූ කර්මාන්ත 05 ක් සභා අරමුදලින් ක්‍රියාත්මක කර තිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**--------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(i) සමාලෝචිත වර්ෂය සඳහා කසළ එකතු කිරීම වෙනුවෙන් වැටුප් හා දීමනා, වාහන හා ඉන්ධන වෙනුවෙන් රු.7,830,177 වැය කර තිබූ අතර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබීම නිසා 2013 වර්ෂයෙන් පසුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර බලපත්‍රය ලබා දීම ප්‍රතික්ෂේප කර තිබුණි.

(ii) අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා, කාබනික පොහොර මධ්‍යස්ථානය අවට ප්‍රදේශවාසීන්ගේ විරෝධය මත 2016 ජුනි 13 දින සිට කාබනික පොහොර නිෂ්පාදනය නතර කර තිබූ අතර රු. 1,114,493 ක වියදමින් ඉදිකර තිබූ කාබනික පොහොර මධ්‍යස්ථානයද නිශ්ක්‍රීයව පැවතුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී කිසිදු ආයතනයකින් කසළ බදු අය කර නොතිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රු.277,500 ක අත්තිකාරම් ලබා දී තිබුණද එම අත්තිකාරම් විධිමත්ව අත්තිකාරම් ලේඛනයේ සටහන්කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා සභාව විසින් වීථි පහන් 2069 ක් නඩත්තු කිරීම වෙනුවෙන් රු.593,795 ක මුදලක් වැය කර තිබුණි. විදුලිබල මණ්ඩලය විසින් අනුමත කල සංඛ්‍යාවට අමතරව සභාව විසින් සවිකර තිබූ වීථි පහන් 1668 ක් වෙනුවෙන් රු.396,795 ක මුදලක් වැයකර තිබුණි. විදුලි බුබුළු හා උපාංග යෙදීම පිළිබඳ විධිමත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 02 ක් සම්පූර්ණ කර ගැනීමටත්, සංඛ්‍යාව 08 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රාථමික තනතුරු සඳහා 2014 වර්ෂයේ සිට බඳවාගෙන තිබූ සේවකයන් 16 දෙනාගෙන්, නියමිත රාජකාරි ඉටු කරවා ගෙන නොතිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා පමණක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් රු.6,279,194 ක් ගෙවා තිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරියේ 1992 සැප්තැම්බර් 30 දිනැති අංක 5/02/1/10 (ii) දරන සංවර්ධන රෙගුලාසි අංක 06 ප්‍රකාරව හෙක්ටයාර 01 ට වැඩි ඉඩම් අනුබෙදුම් කිරීමේදී, සභාවට අයවිය යුතු සියයට 10 ක ඉඩම් ප්‍රමාණයෙන් රූඩ් 03 පර්චස් 05 ක් අඩුවෙන් ලබාගෙන තිබුණි.

(ii) ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තියට අනුව බල ප්‍රදේශයේ විකුණනු ලබන ඉඩම්වල විකිණුම් මිලෙන් සියයට 01 ක බදු මුදල් සභාවට ගෙවිය යුතු වුවද විකුණා තිබූ ඉඩම් 11 කට අදාල ඉඩම් කැබලි 166 කින් සභාවට අයවිය යුතු රු. 1,475,023 ක මුදල අයකර නොතිබුණි.

(ආ) නාවිමන දකුණ මිරිස්වත්ත ක්‍රීඩාංගනයේ වැට ඉදිකිරීම වෙනුවෙන් රු.2,989,068 ක වියදමක් දරා තිබුණද අදාළ භූමිය සභාවට පවරා ගැනීමට 2018 මැයි 15 දින තෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි ලෙස පෙන්නුම් කල රු. 78,605,147 ක වටිනාකමට අදාළ, ඉඩම් කැබලි 103 හි වටිනාකම සභාවට පවරා ගැනීමෙන් පසු නැවත තක්සේරු කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

(අ) මෝටර් රථ හා කරත්ත

සභාවට අයත් වටිනාකම රු.9,984,453 ක් වූ වාහන 04 ක් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ආ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ

රු.6,009,602 ක් වූ ටිපර් රථය වර්ෂය තුළ කි.මී.783 ක් හා රු.5,000,000 ක් වූ බැකෝ ලෝඩරය වර්ෂය තුළ කි.මී.473 ක් පමණක් ධාවනය කර තිබුණි. ලියාපදිංචි අංකයක් රහිත වටිනාකම රු. 400,000 ක් වූ මාර්ග තලනය සමාලෝචිත වර්ෂය තුළ අක්‍රීයව තිබුණි.

**3.6 ආර්ථික නොවූ ගණුදෙනු**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් රු.7,198,400ක් වැය කර ඉදි කරන ලද කැකනදුර මංසන්ධිය අසල පිහිටි ප්‍රධාන බස් නැවතුම්පොළ සඳහා සභා අරමුදලින් රු.1,000,000 ක් වැය කර තිබුණද එය කිසිඳු ඵලදායී කටයුත්තකට යොදා ගෙන නොතිබුණි.

**3.7 හඳුනාගත් පාඩු**

බැකෝ ලෝඩරය කුලියට දීමෙන් හා අක්‍රීය වීමට පෙර මාර්ග තලනය කුලියට දීමෙන් ලැබිය යුතු රු. 264,332 ක මුදල පසුගිය වර්ෂ 05 ක් තිස්සේ අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) වියදම් විෂයයන් 08 ක එකතුව රු.20,267,317 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම අගයන් සියයට 14 සිට 100 අතර පරාසයක පැවතුණි.

(ii) ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.11,155,863 ක් වූ අතර, එම අගයන් සියයට 11 සිට සියයට 23 අතර පරාසයක පැවතුණි.

(iii) ආදායම් විෂයයන් 03 ක හිතකර විචලනයන්ගේ එකතුව රු.18,287,607 ක්වූ අතර, එම අගයන් සියයට 23 ත් සියයට 126 ත් අතර පරාසයක පැවතුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමඟ සාකච්ඡා කර එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

**-------------------------------------**

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවත්වා තිබුණේ රැස්වීම් 02 ක් පමණි.

**5. පද්ධති හා පාලනය**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) ගිණුම්කරණය